# උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වල දක්නට ලැබෙන හෙද නිලධර සේවයේ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ප්‍රදානය - 2021

උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රෝහල්වල පවතින හෙද නිලධරයන් සඳහා වූ තනතුරුවලට කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබාදීමට අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම් කිරීමට මතාපය දක්වන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් 15-02-2021 දිනට ප්‍රථම **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක. 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

## 01. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :

- හෙද නිලධර සේවයේ රාජකාරීන් වල යෙදීම සඳහා කායික හා මානසික නිරෝගීතාවයකින් යුතු බවට සනාථ කෙරෙන සහතිකය මගින් සනාථ කළ යුතුයි.
- අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට වයස අවුරුදු 65 ක් ඇතුළත වූ වයස්කරුවකු විය යුතුයි.
- උතුරු පළාත තුළ දක්නට ලැබෙන හෙද පුරප්පාඩු යටතේ පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන කුමණ ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.
- රාජ්‍ය සේවයෙන් විධිමත් පරිදි විශ්‍රාමලත් හෙද නිලධරයකු විය යුතුයි.
- තමා විසින්ම සේවය අත්හැර ගියා වූ (V.O.P) හෝ විනය කටයුතු හේතුවෙන් විශ්‍රාම ගැන්වූ හෙද නිලධරයකු නොවිය යුතුයි.

## 02. වැටුප :

සෞඛ්‍ය අමාත්‍යාංශයේ 07-02-2018 වන දිනැති අංක 01-56/2018 දරන චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

## සටහන :

සේවක සංඛ්‍යා පුරප්පාඩු පිළිබඳ තොරතුරු හා ආදර්ශ අයදුම්පත්‍ර යනාදී කරුණු www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් ලබාගත හැකිය.

**එස්. තිරුවාකරන්.**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත.**
25-01-2021